# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

---

[සහතිකය සටහන් කළේ **2007** ඔක්තෝබර් මස **15** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 ඔක්තෝබර් මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල **:** රු. 4.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5 .00 යි.

# 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

[සහතිකය සටහන් කළේ 2007 ඔක්තෝබර් මස 15 වන දින]

එල්. ඩී. ඕ.—40/ 2007

**ඇතැම් නිශ්චිත වෙළඳ භාණ්ඩ මත පනවා ඇති බහුවිධ බදු අදාළ කර ගැනීම සහ පරිපාලනය කිරීම ආශ්‍රිත සංකීර්ණතා දුරු කිරීම සඳහා, එවැනි වෙළඳ භාණ්ඩ මත බද්දක්, තීරු බද්දක්, අය බද්දක්, සෙස් බද්දක් හෝ වෙනත් යම් ගාස්තුවක් වශයෙන් අය කරනු ලබන මුදල් වෙනුවට එම නිශ්චිත වෙළඳ භාණ්ඩ මත සංයුක්ත බද්දක් පැනවීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණ සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. (1) මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට සහ එදිනට පසුව, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලබන ඇතැම් වෙළඳ භාණ්ඩ මත “ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද” යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් පනවනු ලැබිය යුතු ය. *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම.*

(2) එවැනි සෑම නියමයක වලංගු කාල සීමාව සහ එවැනි එක් එක් නිශ්චිත භාණ්ඩය සම්බන්ධයෙන් වටිනාකම අනුව (*ad valorem*) හෝ නිශ්චිත පදනමක් මත පනවනු ලබන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ අනු ප්‍රමාණය එම නියමයෙහි නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(3) දින තිහකට වැඩි කාලයක් සඳහා වලංගුව පවතින (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක් ම එම නියමයට යම් භාණ්ඩයක් එකතු කිරීමෙන් හෝ යම් භාණ්ඩයක් ඉන් ඉවත් කිරීමෙන් නැතහොත් එම නියමයේ සඳහන් අනු ප්‍රමාණ ප්‍රතිශෝධනය කිරීමෙන් සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කරනු ලබන කිසිම නියමයක් එම නියමය කරනු ලැබූ දින සිට දින තිහක් ගතවනතුරු සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම නොකළ යුතු ය.

(5) එසේ පනවනු ලබන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සංයුක්ත බද්දක් විය යුතු අතර, (1) වන උපවගන්තිය ප්‍රකාරව පළ කරන ලද යම් නියමයක් බලාත්මකව පවතින කාලය තුළ, මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නීතිවලින් යම් නීතියක් ප්‍රකාරව පනවනු ලබන වෙනත් කිසිම බද්දක්, තීරු බද්දක්, අය බද්දක් හෝ සෙස් බද්දක් නැතහොත් වෙනත් යම් ගාස්තුවක් එවැනි නියමයක සඳහන් වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

2-PL 002378-3,600 (2007/08)

බද්ද රැස් කිරීම, පරිපාලනය කිරීම හා අය කිරීම.

**3**. මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් වන යම් බද්දක්, තීරු බද්දක්, අය බද්දක් හෝ සෙස් බද්දක් නැතහොත් වෙනත් ගාස්තුවක් වෙනුවට, 2 වන වගන්තිය යටතේ පනවනු ලැබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රැස් කිරීම, පරිපාලනය කිරීම සහ අය කර ගැනීම සිදු කළ යුතු ය.

විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතු බව.

**4**. මේ පනත ප්‍රකාරව විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වශයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අයකරගනු ලබන සියලු මුදල් ඔහු විසින් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

ඇතැම් වෙළඳ භාණ්ඩ මත බද්ද පැනවීම අමාත්‍යවරයා විසින් අත්හැරිය හැකි බව.

**5**. (1) 2 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, පවත්නා ආර්ථික කරුණු සැලකිල්ලට ගැනීමේ දී සුදුසු යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් ඒ නියමයේ නිශ්චිතව දැක්වෙන කාල පරිච්ඡේදයක් සඳහා යම් නිශ්චිත භාණ්ඩයක් සම්බන්ධයෙන් 2 වන වගන්තිය යටතේ අය කර ගත හැකි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අත්හරිනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පළ කරනු ලබන නියමයක් බලාත්මකව පවතින කාලසීමාව තුළ, මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන කිසියම් නීතියක් ප්‍රකාරව පනවන ලද යම් බද්දක්, තීරු බද්දක්, අය බද්දක් හෝ සෙස් බද්දක් නැතහොත් වෙනත් යම් ගාස්තුවක්, එවැනි යම් නියමයක නිශ්චිතව දැක්වෙන වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

බද්දේ අදාළ වන අනුප්‍රමාණය නිශ්චිත කිරීම.

**6**. 2 වන වගන්තිය යටතේ වූ නියමයකට යම් වෙළඳ භාණ්ඩයක් යටත් කර ඇති අවස්ථාවක, එම වෙළඳ භාණ්ඩය සම්බන්ධයෙන් ගෙවිය යුතු බද්දේ අනුප්‍රමාණය ආයාත බිල්පත භාරදෙන අවස්ථාවේ, එම භාණ්ඩය සම්බන්ධයෙන් අදාළ කරගනු ලබන අනුප්‍රමාණය ම වන්නේ ය.

නියමය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බව.

**7**. 2 වන වගන්තිය හා 5 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් කරනු ලබන සෑම නියමයක් ම—

(i) එම නියමයට අමාත්‍යවරයා සිය අත්සන තැබූ වහාම ක්‍රියාත්මක විය යුතු ය;

(ii) හැකි පහසු ඉක්මනින් ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය ;

(iii) ඉන්පසු හැකි පහසු ඉක්මනින් පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලැබිය යුතු ය ; සහ

(iv) පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු නොලැබුවේ නම් එය යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි එම යෝජනා සම්මතයේ දින සිට බලපවත්වන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

යම් නියමයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබීමේ බලපෑම.

**8**. 7 වන වගන්තියේ (iv) වන ඡේදයේ විධිවිධාන සළසා ඇති පරිදි 2 වන වගන්තිය හෝ 5 වන වගන්තිය යටතේ කරන ලද යම් නියමයක් පරිච්ඡින්න කරනු ලැබූ අවස්ථාවක දී, එම නියම අදාළ වන වෙළඳ භාණ්ඩ, මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නීතිවලින් යම් නීතියක් ප්‍රකාරව පනවා ඇති යම් බද්දක්, තීරු බද්දක්, අය බද්දක් හෝ සෙස් බද්දක් නැතහොත් වෙනත් ගාස්තුවක් ගෙවීමට යටත් වන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**9**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## උපලේඛනය

(2 වන සහ 8 වන වගන්ති)

1. 2002 අංක 11 දරන මුදල් පනත ( 1 වන කොටස)
2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත
3. 2005 අංක 5 දරන මුදල් පනත (1 වන කොටස)
4. (235 වන අධිකාරය වූ) රේගු ආඥා පනත
5. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත
6. 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.